## වෂර් 2021 ක්වූ සැප්තැම්බර් මස 23 වන දින උඩපළාත ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ වාතර්ාව

වේලාව - පෙරවරු 10.00

- ❖ පැමිණීම

| | |
|---|---|
| 01.D.G ගුණසේන මහතා | ගරු සභාපතිතුමා |
| 02.L.N අසේල අමරසේන මහතා | ගරු උප සභාපතිතුමා |
| 03.R.M කීතර්ි රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 04.A.ධමර්සිරි අගලවත්ත මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 05. .S.A නවරත්න බණ්ඩා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 06 D.G ජයන්ත කීතර්ිසිංහ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 07. U.G පාලිත මහින්ද ජිනදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 08. M.G මොහොමඩ් මුරාඩ් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 09. M.G උපචන්ද්‍ර ජයපති මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 10. M.G.R පාලිත අබේරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 11. D.M දීසායු මංජුල දිසානායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 12. A.C මොහොමඩ් ෆසාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 13. D.W.G හේමකුමාර නයනානන්ද මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 14. W.ප්‍රේමතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 15. A.H.A රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 16. G.A අරුණ ප්‍රසන්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 17. R.M ප්‍රේමරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 18.H.M නීල් සුගත් කුමාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 19. A. සමන්ත කුමාර ආරියදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 20. W.D.G ගුණතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 21. R.G රන්ජන් රාජපක්ෂ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 22. A ධනුෂ්ක ඉන්ද්‍රජිත් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 23. මුතු නීලමේගම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |

24. තංගවේලු කාමරාජන් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

25. D. ප්‍රසන්න මනෝජ් තිලකරත්න මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

26. H.G සුසිලාවති මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

27. වත්සලා චතුරාණි සේනානායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

28. W. ඩිමෝෂි ඥාණලතා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

29. K.W කෝකිලා කුමාරි වරාහේන මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

30. H.G සුභද්‍රා සමරනායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

31. පිච්චෙයි සෙල්වපූනේස්වරී මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

32. කුමාරවේලු කනගරත්නම් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

33. N.R.M.D නවරත්න රත්නායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

34. ගයානී ශ්‍රියාමාලා ඇතුගල්පේ මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

35. චාමික රුවන් දසනායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

<u>සභාවට නොපැමිණි මන්ත්‍රීවරුන්</u>

36.W.M.G.W.C.B වෙරපිටිය මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

37. R.M උදයකුමාර දිසානායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

38. R.M රවින්ද්‍ර දිනුක රත්නායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

39. H.M යසස් බණ්ඩාර දෙනුවර මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

40. P.T.G වයලා විනෝදනි චන්ද්‍රපාල මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

41. සෙල්වරාජ් කාතරීකා මෙනෙවිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

42. G.R චමිලා ෆොන්සේකා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

43. K සුප්පයියා ජීවා මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

.<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

පෙරවරු 10.00ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

<u>1.පසුගිය මහසභාවේ සභා වාර්තාව සභා සම්මත කිරිම</u>

පසුගිය අගෝස්තු මස 17 වන දින මහ සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

පසුගිය අගෝස්තු මස 17 වන දින මහ සභා වාර්තාව සභා සම්මත කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා**

මා විසින් ගියවර සභාවට පෙර සභාවේදී ගරු මන්ත්‍රී නම් සදහන් කිරීමේ දි ගරු තිස්ස රත්නායක මන්ත්‍රීතුමා යන නම ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා ලෙස ගියවර සභා වාර්තාවේ සදහන් වී ඇති බවත් එය ගරු තිස්ස රත්නායක මන්ත්‍රීතුමා ලෙස සංශෝධනය විය යුතු බවත් සදහන් කරමින් අගෝස්තු මස 17 වන දින මහ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මොහොමඩ් මුරාඩ් මන්ත්‍රීතුමා

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

ගියවර මහ සභා වාර්තාවේ අංක 07 වන පිටුවේ පුස්සැල්ලාව වෙළඳ සංකීණර්ය පිළිබඳව කථා කිරීමේදී තමාගේ අතින් වැරදීමකින් ඉදිරියේ ඇති කඩ 5ක් ලෙස සදහන් වී ඇති බවත් එය කඩ 3 ක් ලෙස නිවැරදි විය යුතු බවත් එසේම න්‍යාය පත්‍රයේ කමර්ාන්ත අනුමැතියේදි මස්ගොල්ලවත්ත ජල යෝජනා ක්‍රමය ලෙස රු.100000.00 වෙන් කර තිබූ බවත් අද මෙම සභා වාර්තාව දෙස බලන කල න්‍යාය පත්‍රයේ තිබූ යෝජනාව නොමැති බවත් සභා වාර්තාවේ තුම්පැලවක පන්සල හරහා ලබාදෙන ජල යෝජනා ක්‍රමය ලෙස රු.100000.00 සදහන් බවත් එසේම එම යෝජනාව ගරු සභාපතිතුමාගේ යෝජනා යටතේ ඇතුළත් කර තිබූ බවත් නමුත් කමර්ාන්ත කමිටුවේදි එය මුල්ගමවත්ත ජල යෝජනා ක්‍රමය ලෙස තිබූ බවත් කමර්ාන්ත කමිටුවේ නොතිබූ යෝජනාවක් සභා වාර්තාවේ සදහන් වි ඇති බවත් ගියවර සභාවේ එක් කමර්ාන්තයක් යෝජනා කල අතර සභා වාර්තාවේ කමර්ාන්ත 5ක් අනුමත වී ඇති බවත් එය කෙසේ වුවාදැයි අපට ප්‍රශ්නයක් ඇති බවත් එනිසා මෙම සභා වාර්තාව අසත්‍ය වාර්තාවක් ලෙසට මම යෝජනා කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තවත් යෝජනා තිබෙන බවත් එම යෝජනා හදිසියේ සදහන් කරන බවට තමා ඔබතුමාලාට පැවසූ බවත් ගරු අගලවත්ත මන්ත්‍රීතුමාගේ යෝජනා ඇස්තමේන්තු කර නොතිබූ නිසා නොදැමූ බවත් ඔබතුමන්ලාට පවසා ඔබතුමන්ලාගේ එකගතාවය මත මෙම යෝජනා ඇතුළත් කල බවත් සදහන් කරන ලදි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

පසුගිය මහ සභා වාර්තාව සම්මත වු මෙම අවස්ථාවේ ගරු අගලවත්ත මන්ත්‍රීතුමා චෝදනාවක් කල බවත් මීට පෙර සභා වල ගරු අගලවත්ත මන්ත්‍රීතුමාගේ යෝජනා රාශියක් දමා තිබූ බවත් අපි ප්‍රශ්න නොකර ඒවා අනුමත කල බවත් කිසිදා විරුද්ධ නොවූ බවත් ගියවර සභාවට එම යෝජනාව ඉදිරිපත් කිරීමේදි සමහර විට වරදක් වන්නට ඇති බවත් නමුත් අපි පක්ෂ භේදයකින් තොරව සමසේ සලකා කටයුතු කල යුතු බවත් එම යෝජනා ඉවත් කලත් අපට ප්‍රශ්නයක් නැති බවත් සභාවේ ගරු මන්ත්‍රීවරුන් අතරින් ජ්‍යෙෂ්ඨත්වයට අපි ගරු කරන බවත් දේශපාලනය

කිරිමේදි ප්‍රශ්න ඇතිවීම සාමාන්‍ය බවත් එම ප්‍රශ්න දුරින් දුර ගෙන යා යුතු නැති බවත් සඳහන් කරන ලදි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

මෙහි වප්ලි ජනපදය හරහා දොරගල පාරේ වප්ලි හංදියේ කාණු පද්ධතිය සකස් කිරීම සඳහා රු.165000.00 යොදා ඇති බවත් තමා මෙය අධ්‍යනය කල බවත් ප්‍රයිම් ලෑන්ඩ් ආයතනයේ ඉඩම් සංවධර්නය කිරිමේදී ඔවුන් ඇළක් සාදා කාපට් මාගර්යට වතුර එවා ඇති බවත් එම බැම්ම ප්‍රයිම් ලෑන්ඩ් ආයතනය මඟින් සෑදිය යුතු බවත් මෙතෙක් මෙවැනි ආපදාවක් මෙම පාරට නොතිබූ බවත් එය සභාවෙන් සෑදිය යුතු නැති බවත් එම ආයතනයට දන්වා ඔවුන් ලවා සෑදිය යුතු බවත් යෝජනා අතරින් මන්ත්‍රී යෝජනා පිළිබඳව අපට ගැටළුවක් නැති බවත් තමාටද කමර්ාන්ත සඳහා මීට පෙර රු.100000.00 ලැබූ බවත් මාගේ කොට්ඨාශ වල ගරු කිතරී මන්ත්‍රීතුමාගේ නැන්දාගේ ගෙදර ළඟට යැයි රු.350000.00ද සහකාර පොලිස් අධිකාරි යන පාරට යැයි රු.300000.00ද ලබා දි ඇති බවත් ඊට වඩා කීයක් හෝ තමාට ලබාදී ඇත්නම් පවසන ලෙසත් එවිට තමා ඉල්ලා අස්වන බවත් සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තමා කොට්ඨාශ බැලීමෙන් තොරව මුදල් වෙන් කල බවත් තමා කිසිවෙකුට වෙනසක් නොකරන බවත් අනෙක සභාව විෂයභාර නිළධාරිනිය කොරෝනා වෛරසය ආසාදනය විම නිසා නිරෝධායනය වන බවත් එනිසා සභා වාථර්ාවේ අඩුපාඩු ඇතිදැයි නොදන්නා බවත් සඳහන් කරන ලදි.

ගරු කිතරී රත්නායක මන්ත්‍රීතුමා

මහ සභා වාථර්ාව සම්මත වූ පසු නැවත කථා කිරීමට සිදුවීම සම්බන්ධව තමා කණගාටු වන බවත් කීතරී මන්ත්‍රීතුමාගේ නැන්දාගේ ගෙදර ළඟ බෝක්කුව ලෙස ගරු අගලවත්ත මන්ත්‍රීතුමා පැවසු බවත් එම කමර්ාන්තය 2015 වසරේදි තමා අනෙක් පස මන්ත්‍රීවරයෙකුව සිටි කාලයේ යෝජනාවක් බවත් එතුමා එය දන්නා බවත් මෙය තමා ඉල්ලා තමාගේ නමින් දුන් රු. රු.350000.00ක කමර්ාන්තයක් නොවන බවත් එම කමර්ාන්තය තුන් පාරක් ණයහිමි වි නොතිබූ බවත් එනිසා මෙවර තමා මැදිහත් වී ජනතාව තමාගෙන් කල ඉල්ලීමක් නිසා ගරු සභාපතිතුමාද ඒ සම්බන්ධව උනන්දු වූ නිසා කල බවත් එසේම තමා තමාට අදාළ රු.700000.00ක කමර්ාන්ත පමණක් කල බවත් තමා කමර්ාන්ත කමිටුවේ සභාපති බවත් නමුත් මින් පෙර යෝජනා දැමූ ගමන් අනුමත වු යෝජනාද තිබූ බවත් මේවා කථා කලොත් හිත් රිදෙන බවත් එනිසා කථා නොකරන බවත් ඊළඟ සභා වලින් මෙලෙස කමර්ාන්ත කමිටුවට කල නොහැකි බවත් එදා ගරු ජයන්ත මන්ත්‍රීතුමා,ගරු රත්නායක මන්ත්‍රීතුමා සහ තමා හදිසි යෝජනා 3ක් ලබාදුන් බවත් එයින් එකක්වත් ඇතුළත් කර නොමැති බවත් අපි ගරු සභාපතිතුමා පත්කල බවත් සහකාර පොලිස් අධිකාරි යන පාර සකස් කිරීමේ කමර්ාන්තය කිරීම සඳහා තමා ගරු අගලවත්ත මන්ත්‍රීතුමාට ලබා දෙන බව ගරු සභාපතිතුමා තමාට පැවසු බවත් කමර්ාන්ත කමිටුවේදි අනුමත වු සියල්ල නීත්‍යානුකූලව අනුමත වු බවත් ඉදිරියේදී කමර්ාන්ත කමිටුවට මීට වඩා අවධානය දෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලන බවත් වරදවා වටහා නොගන්නා ලෙස ගරු අගලවත්ත මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටින බවත් සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව සභා වාථර්ාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

2. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

**ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

1. දොළුව මහජන පුස්තකාලය ඩිජිටල් පුස්තකාලයක් ලෙස සංවධර්නය කිරීමේදි 2021.09.15 වන දිනට එහි ප්‍රගතිය පිළිබඳ ව සඳහන් නිවේදනය සභාගත කරන ලදි.

2. සහනදායී පදනම මත යතුරුපැදි ලබාදුන් නියෝජිතයින්ගේ යතුරුපැදි, එම හිමිකරුවන් වෙත පවරා දිමට අදාළ ලිපි පළාත් පාලන දෙපාතර්මේන්තුවට යොමු කිරීමෙන් වැළකී විධිමත්ව සකස් කර නාරාහේන්පිට මෝටර් රථ ප්‍රවාහන ෙකාමසාරිස් වෙත යොමු කරන ලෙස දන්වා පළාත් පාලන ආයතනය මඟින් එවා ඇති සිපිසි/සිඑල්ජී/1/2 යතුරුපැදි අංක දරන ලිපිය සම්බන්ධ නිවේදනය සභාගත කරන ලදි.

3. සභාව වෙත එවා ඇති සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි සභාවට ඉදිරිපත් කිරිම

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා
**සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි** නොමැති බව සඳහන් කරන ලදි.

4.කල් දී ඇති ප්‍රශ්න - නොමැති බව සඳහන් කරන ලදි.

5.කල් දී ඇති යෝජනා

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (1)

5(1.1) පුස්සැල්ලාව නගරයේ පොදු වැසිකිළිය බදු පදනම මත ලබාදුන් බවත් මෙම වසංගත තත්වය මත ඔවුන්ට එය කරගත නොහැකි වු බවත් පොදු වැසිකිළිය පටන් ගත් දින සිට මේ දක්වා රු.3001.68 වු ජල බිල්පතක් තිබෙන බවත් සඳහන් කරමින් සංවරණය සීමා කිරීම, ඇඳිරිනීතිය පැවතීම,පොදු වැසිකිළියේ ස්ථානය මාරු කිරීම ආදි හේතු මත ආදායම නොලැබීම නිසා පුස්සැල්ලාව නගරයේ පොදු වැසිකිළියේ රු.3001.68 වු ජල බිල්පත ගෙවීමට සහනයක් ලබා දෙන ලෙසට බදුකරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් මහ සභා තීරණයක් ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු ධනුෂ්ක ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමා

දැනට රටෙහි පවතින වසංගත තත්වය නිසා ඔවුන්ට ආදායමක් හිමි නොවන බවත් එම මහත්මිය ඒ සම්බන්ධව තමාට පැවසු බවත් සඳහන් කරමින් පුස්සැල්ලාව නගරයේ පොදු වැසිකිළියේ රු.3001.68 වු ජල බිල්පත ගෙවීමට සහනයක් ලබාදීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (2)

5(1.2) ගොඩවෙල බුම්මලේ සුසානභූමියේ මැනුම් කටයුතු කිරීම සම්බන්දයෙන් අපි මිනින්දෝරු දෙපාතර්මේන්තුවට සඳහන් කර යැවුවත් එම කටයුත්ත ඔවුන්ට කල නොහැකි බවත් මිළ ගණන්

තුනක් කැදවා බලයලත් මිනින්දෝරුවරයෙක් යටතේ කරගන්නා ලෙස දන්වා එවා ඇති බැවින් ඒ සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>**

ආදාහනාගාර ප්‍රශ්නය මෑත කාලයේදි ඉතා අත්‍යාවශ්‍ය කාරණයක් බවත් කොරෝනා වසංගතය නිසා මෘතදේහ ආදාහනයේදී විශාල ගැටළු ඇති වී ඇති බවත් මෙම යෝජනාව තමා පළමුව 2011 වසරේදිත් දෙවැනි වර මෙම සභාවේදිත් කලක් පුරාවටම යෝජනා කල බවත් මිනින්දෝරු දෙපාතර්මේන්තුවට කල නොහැකි නිසා මිළ ගණන් තුනක් කැදවා බලයලත් මිනින්දෝරුවරයෙක් යටතේ පුළුවන් තරම් ඉක්මනින් මාස දෙක තුනකින්වත් ඉටුකරගත යුතු බවත් සදහන් කරමින් එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05.1 (3)</u>

5 (1.3) පරිගණක පද්ධතිය ජාලගත කිරීමේ යෝග්‍යතා වාතර්ාව අනුව මිළ ගණන් සදහන් කර නොමැති බවත් එසේම බී ලයින් ආයතනයෙන් ම එම කටයුතු ඉටු කරගැනීම සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>**

පරිගණක පද්ධතිය ජාලගත කිරීමේ යෝග්‍යතා වාතර්ාව අනුව මිල ගණන් ලබාගැනීමට අපහසුතාවයක් ඇති නිසා බී ලයින් ආයතනයෙන් එවා ඇති පැරණි මිල ගණන් යටතේ එම කටයුතු ඉටු කරගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05.1 (4)</u>

5(1.4) WPPF-7352 කැබ් රථයේ අළුත්වැඩියාව සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.(විශේෂ කමිටු තීරණය සහ මධ්‍යම පළාත් යාන්ත්‍රික ඉංජිනේරුතුමියගේ නිදෙර්ශය මත)

***<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>***

මෙම WPPF-7352 කැබ් රථයේ අළුත්වැඩියාව සිදුකිරීම සුදුසු බවට යෝජනාව මම ගේන අතර ගැටළුකාරී තත්වයක් තිබෙනවා නම් පසුව ඒ සම්බන්ධව කටයුතු කිරීම සුදුසු බවට සදහන් කරන ලදි.

<u>**ගරු කිතරී රත්නායක මන්ත්‍රීතුමා**</u>

පරීක්ෂණයකට යටත්ව මෙම WPPF-7352 කැබ් රථයේ අළුත්වැඩියාව සිදුකිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>**ගරු උප සභාපති අසේල අමරසේන මහතා**</u>

මෙම වාහනය සකස් කිරීම සම්බන්ධයෙන් පසුගිය දින වල කමිටුවක් පත් කල අතර අපේ ගරු මන්ත්‍රීවරු කොටසක් කැඳවා යුනයිටඩ් මෝටසර් ආයතනයේ ඉංජිනේරු මහතා, ලේකම්තුමිය, තාක්ෂණ නිළධාරි, වාහන භාර නිළධාරි යන අය කැඳවා අපි කමිටුව ගෙන ගිය අතර එහිදි තමා, ගරු අගලවත්ත මන්ත්‍රීතුමා,ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා යන අය ප්‍රශ්න කල බවත් මෙම කැබ් රථය අළුත් කැබ් රථයක් බවත් විශේෂයෙන් මේ සම්බන්ධව වරදකරු රියදුරුද නැතිනම් කවුරුන්ද යන්න පරීක්ෂණයක් මඟින් සොයා ගැනීමට කොමසාරිස්තුමා හරහා සහකාර කොමසාරිස්තුමිය හා මහනුවර දිස්ත්‍රික් යාන්ත්‍රික ඉංජිනේරුතුමිය පත් කර ඇති බවත් මෙම ගෙන ආ යෝජනාව ගරු ශාන්ත මන්ත්‍රීතුමා හා ගරු කීතරී මන්ත්‍රීතුමා යෝජනා ස්ථිර කල බවත් මෙම වාහනයේ රියදුරු වරදකරු නම් ඔහුට දඩුවම් දිය යුතු බවත් පරීක්ෂණය මඟින් එය සිදුවන බවත් විශේෂයෙන් මෙම වාහනය අළුත්වැඩියා කිරීම සඳහා වැය වන මුදල පිළිබඳව කොමසාරිස්තුමා හා සහකාර කොමසාරිස්තුමිය දැනුවත් කර මෙම වැඩ කටයුත්ත කරගමු යැයිද ඉතා ඉක්මනින් මෙම මුදල ගෙවා WPPF-7352 කැබ් රථය අළුත්වැඩියා කරගමු යැයිද එසේම ලේකම්තුමිය විසින් සභාවේ රියදුරු මහත්වරු මසකට වරක්වත් ගෙන්වා වාහන සම්බන්ධව සොයා බලා අවශ්‍ය දැනුවත් කිරීම් කල යුතු බවත් මතක් කරමින් මෙම වාහනයේ අළුත්වැඩියාව සිදු කල යුතු බවට සඳහන් කරන ලදි.

<u>**ගරු අගලවත්ත මන්ත්‍රීතුමා**</u>

මෙම කැබ් රථයේ අළුත්වැඩියාව සම්බන්ධයෙන් ගරු උප සභාපතිතුමා වැදගත් අදහස් දැක්වීමක් කල බවත් නමුත් මෙම අළුත්වැඩියාව සඳහා අවසර දෙනවා නම් මෙම අදාළ මුදල ගෙවීමටද අපි අවසර දිය යුතු බවත් එනිසා මේ සම්බන්ධව පරීක්ෂණයක් නොකර මෙහි වරදකරුවන් සොයා ගැනීමට පෙර මෙම අළුත්වැඩියාව කිරීම සම්බන්ධයෙන් තමාගේ පෞද්ගලික විරෝධය සඳහන් කරන ලදි.

<u>**ගරු පාලිත මහින්ද ජිනදාස මන්ත්‍රීතුමා**</u>

මුලින්ම පරීක්ෂණයක් කර ඉන්පසු වාහනය අළුත්වැඩියා කරනවාට තමා එකඟ බවත් පරීක්ෂණයක් නොකර මෙම අළුත්වැඩියාව කිරීම සම්බන්ධයෙන් තමාගේ ද පෞද්ගලික විරෝධය සඳහන් කරන ලදි.

<u>**ගරු ප්‍රේමරත්න බණ්ඩාර මන්ත්‍රීතුමා**</u>

පරීක්ෂණයක් නොකර මෙම වාහනය අළුත්වැඩියාව සිදුකිරිමට තමා ද විරුද්ධ වන බව සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

මෙම වාහනය සම්බන්ධයෙන් පරීක්ෂණයක් කිරීමට යොමු කර ඇති බව සඳහන් කරන ලදි.

<u>ගරු ප්‍රේමරත්න බණ්ඩාර මන්ත්‍රීතුමා</u>

මෙය කෝටි ගාණක් වටිනා රජයේ දේපොළක් බවත් මේ සම්බන්ධව අපි අදහස් ප්‍රකාශ නොකලා නම් එහි වගකීම අපිට දැරීමට සිදුවන බවත් සදහන් කරන ලදි.

*<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>*

මෙය සභාව සතු වාහනයක් නිසා සකස් කරනවාට කවුරුන් හෝ විරුද්ධ නැති බව තමා සිතන බවත් නමුත් සමහර ගරු මන්ත්‍රීවරු චෝදනාවන් ඉදිරිපත් කරන බවත් තමාද වැරදි උපදෙස් ලබාදීම නිසා අදාළ යුනයිටඩ් ආයතනයට චෝදනා කරන බවත් නමුත් ඔබතුමන්ලා පරීක්ෂණ කරන්න කියුවත් කුමකට කා සදහා දැයි නොපවසන බවත් සෙසු චෝදනා තිබෙනවා නම් එම චෝදනා ලිඛිතව ලබා දෙන ලෙසත් සදහන් කරන ලදි.

<u>ගරු  අගලවත්ත මන්ත්‍රීතුමා</u>

මෙම වාහනයේ එන්ජිම ක්‍රියා විරහිත වීමට හේතුව එන්ජිමේ තෙල් මාරු නොකිරීම බවත් එම වාහනය නඩත්තු කරන ආයතනය මඟින් ඔයිල් බල්බය පත්තු වී  යදී ධාවනයට අවසර දිම නිසා එහි වගකීම එම ආයතනය ගත යුතු බවත් ඔයිල් මීටරය පත්තු වී තිබියදී ධාවනය කළානම් එහි වගකීම රියදුරු භාරගත යුතු බවටත් මම යෝජනා කරන බවත් එහි අවසන් නිගමනය ආ පසු අළුත්වැඩියාව කල යුතු බවත් එසේ නොමැති නම් මෙහි වගකීම ගරු මන්ත්‍රීවරු දැරිය යුතු බවත් සදහන් කරන ලදි.

<u>ගරු **A.H.A** රත්නායක මන්ත්‍රීතුමා</u>

මාස ගණනක් පුරාවට අපි මේ සම්බන්ධව කථා කරන බවත් මෙහි සම්පූණර් වරද රියදුරු මත පැටවිය නොහැකි බවත් මෙම පරීක්ෂණය සඳහා තව මාස දෙක තුනක්වත් යන බවත් එනිසා මෙම වාහනය අළුත්වැඩියා කිරීම සුදුසු බව තමාගේ අදහස බවත් සදහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

WPPF-7352 කැබ් රථයේ අළුත්වැඩියාව සිදුකිරිම සඳහා ඡන්ද විමසීමක් කල යුතු බවට මම යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>

මේ සම්බන්ධයෙන් රියදුරු වරදකරු නම් පරීක්ෂණයෙන් ඔප්පු වන බවත් මෙම වාහනය විනාශ වනවාට අපි අකමැති බවත් රාජකාරි කටයුතු සඳහා මෙම වාහනය අවශ්‍ය බවත් මේ සඳහා ඉදිරියේදී පරීක්ෂණයක් සිදු කර අදාළ පාශර්වයන්ට දඩුවම් දෙන ලෙස අවධාරණය කරන බවත් මෙම වාහනය අළුත්වැඩියාව සඳහා අපි අවසර දෙන බවත් සදහන් කරමින් ඡන්ද වීමසීමක් සිදු කල යුතු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු තංගවේළු කාමරාජන් මන්ත්‍රීතුමා</u>

මෙම වාහනය සෑදිය යුතු බවත් එසේම ඉන්පසු ඒ සඳහා පරික්ෂණයක් අවශ්‍ය බවත් සදහන් ලදි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

මේ පිළිබඳව දැනට මාස තුනක පමණ සිට කථා කරන බවත් පරීක්ෂණයක් කරනවා නම් මේ වන විට කල හැකිව තිබු බවත් නමුත් මෙය අපි ලවා සාදවා ගත් පසු එහි වගකීම අපට දැරීමට සිදු වන බවත් පළාත් පාලන කොමසාරිස්තුමාද සභාවේ අනුමැතිය ගෙන සකස් කරන ලෙසට සදහන් කර ඇති බවත් එයට අපි විරුද්ධ වන බවත් සදහන් කරන ලදි.

ඒ අනුව,

**WPPF-7352 කැබ් රථයේ අළුත්වැඩියාව සම්බන්ධයෙන් ඡන්ද විමසීම**

| අනු අං. | නම | පක්ෂව | විපක්ෂව | වැලකී සිටිම | නොපැමිණිම |
|---|---|---|---|---|---|
| 01 | ගරු සභාපති ඩී.ජී. ගුණසේන මහතා | පක්ෂ | | | |
| 02 | ගරු උප සභාපති අසේල අමරසේන මහතා | පක්ෂ | | | |
| 03 | ගරු කීතරි රත්නායක මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 04 | ගරු ධම්සිරි අගලවත්ත මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 05 | ගරු S.A නවරත්න බණ්ඩා මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 06 | ගරු ජයන්ත කීතරිසිංහ මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 07 | ගරු C.B වේරපිටිය මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 08 | ගරු පාලිත මහින්ද ජිනදාස මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 09 | ගරු මොහොමඩ් මුරාඞ් මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 10 | ගරු උපචන්ද්‍ර ජයපති මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 11 | ගරු R පාලිත අබේරත්න මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 12 | ගරු දීසායු මංජුල දිසානායක මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 13 | ගරු උදයකුමාර දිසානායක මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 14 | ගරු කාදර් මොහොමඩ් ෆසාල් මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 15 | ගරු හේමකුමාර නයනානන්ද මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 16 | ගරු W ප්‍රේමතිලක මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 17 | ගරු රවින්ද්‍ර දිනුක රත්නායක මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 18 | ගරු A.H.A රත්නායක මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 19 | ගරු අරුණ ප්‍රසන්න මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 20 | ගරු ප්‍රේමරත්න බණ්ඩාර මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 21 | ගරු නීල් සුගත් කුමාර මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 22 | ගරු සමන්ත කුමාර ආරියදාස මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 23 | ගරු W.D.G ගුණතිලක මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 24 | ගරු යසස් බණ්ඩාර දෙනුවර මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 25 | ගරු රන්ජන් රාජපක්ෂ මන්ත්‍රීතුමා | | විපක්ෂ | | |
| 26 | ගරු ධනුෂ්ක ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 27 | ගරු මුතු නීලමේගම් මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 28 | ගරු තංගවේලු කාමරාජන් මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 29 | ගරු ප්‍රසන්න මනෝජ් තිලකරත්න මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 30 | ගරු සුසිලාවති මන්ත්‍රීතුමිය | පක්ෂ | | | |
| 31 | ගරු වත්සලා චතුරාණි සේනානායක මන්ත්‍රීතුමිය | පක්ෂ | | | |
| 32 | ගරු ඩිමෝෂි ඥාණලතා මන්ත්‍රීතුමිය | පක්ෂ | | | |
| 33 | ගරු වයලා විනෝදනි  මන්ත්‍රීතුමිය | | | | නොපැමිණි |
| 34 | ගරු කෝකිලා කුමාරි මන්ත්‍රීතුමිය | පක්ෂ | | | |
| 35 | ගරු සෙල්වරාජ් කාතරීකා මන්ත්‍රීතුමිය | | | | නොපැමිණි |
| 36 | ගරු චමිලා ෆොන්සේකා මන්ත්‍රීතුමිය | | | | නොපැමිණි |
| 37 | ගරු සුබද්‍රා සමරනායක මන්ත්‍රීතුමිය | පක්ෂ | | | |
| 38 | ගරු සුප්පයියා ජීවා මන්ත්‍රීතුමා | | | | නොපැමිණි |
| 39 | ගරු සෙල්වපූනේස්වරී මන්ත්‍රීතුමිය | පක්ෂ | | | |
| 40 | ගරු කුමාරවේලු කනගරත්නම් මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 41 | ගරු නවරත්න රත්නායක මන්ත්‍රීතුමා | පක්ෂ | | | |
| 42 | ගරු ගයානී ශ්‍රියාමාලා මන්ත්‍රීතුමිය | පක්ෂ | | | |
| 43 | ගරු චාමික රුවන් දසනායක  මන්ත්‍රීතුමා | පක්ෂ | | | |

WPPF-7352 කැබ් රථයේ අළුත්වැඩියාවට පක්ෂව ඡන්ද - 23

WPPF-7352 කැබ් රථයේ අළුත්වැඩියාවට විපක්ෂව ඡන්ද - 10

නොපැමිණි - 10

ඒ අනුව වැඩි ඡන්ද 23කින් WPPF-7352 කැබ් රථයේ අළුත්වැඩියාවට සිදුකල යුතු බවට ගෙන ආ යෝජනාව සභා සම්මත විය.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

මෙම වාහනය ධාවනය කිරීම සිදු කලේ අළුත් ළමයෙකු සමඟ බවත් ඇත්ත කාරණය එය බවත් එය ගරු පාලිත මන්ත්‍රීතුමා සමඟ තමා පැවසු බවත් වරදක් වූවොත් එය තමා භාරගන්නා බවත් පරීක්ෂණයකට යටත්ව අළුත්වැඩියා කිරීම සිදුකරන ලෙස තමා පවසුවේ එනිසා බවත් සදහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (5)

5 (1.5) උඩපළාත ප්‍රාදේශීය සභාවට අයත් PB-7657 දරන කෘෘ කැබ් රථයේ පැවති දෝෂ 2021.08.27 දින මධ්‍යම පළාත් සභාවේ යාන්ත්‍රික ඉංජිනේරුවරියට දැන්වූ පසු එතුමියගේ උපදෙස් මත එම රථය එක්සත් ඩීසල් මෝටසර් ආයතනය මඟින් ගලවා පරීක්ෂා කර බලා රු.153623.00ක ඇස්තමේන්තුවක් ලබාදී ඇති අතර මෙම වාහනය අළුත්වැඩියා කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්තුමාගේ අවසරය ලබාගත යුතු බවත් එම මුදල වැය කර PB-7657 කෘෘ කැබ් රථය අළුත්වැඩියා කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

*ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා*

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

මෙම PB-7657 දරන කෘෘ කැබ් රථය සෑදීමට අවසර දුන් බවත් මේ වන විට මෙම වාහනය එක්සත් ඩීසල් මෝටසර් ආයතනයේ ද අනෙක් වාහනය කටුගස්තොට ගැරේජයේද මෙලෙස වාහන 2ක් මේ වන විට ගැරේජ් වල ඇති බවත් එයටද තමා විරුද්ධ බවත් මෙම කැබ් රථය ගැරේජයට දැමීමට අවසර නොගත් බවත් මෙම සභාව කාරක සභාවක් බවට පත් කොට මෙම වාහන වල ධාවන සටහන් රිපෝට් හා ඒ සම්බන්ධ නිළධාරීන් සභාවට ගෙන්වීමට තමා කැමති බවත් සඳහන් කරමින් මෙම සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු පාලිත මහින්ද ජිනදාස මන්ත්‍රීතුමා

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

මෙම කාරක සභාව නැවත මහ සභාවක් බවට පත් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු පාලිත මහින්ද ජිනදාස මන්ත්‍රීතුමා

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

මෙම වාහනය නියමිත පරිදි සේවා කර නොමැති බවත් එසේම කර ඇති සේවා පිළිබඳව අපේ විශ්වාසයක් නොමැති බවත් මෙම වාහනය 245000KM ධාවනය කර ඇති බවත් මේවාට වග කියන්නේ කවුරුන්ද යන්න විමසන බවත් ගිය අප්‍රේල් මාසයේ රෝද හතරටම රු.44400.00 ගෙවා බ්‍රේක් ලයිනර් ගසා ඇති බවත් නැවත බ්‍රේක් ලයිනර් ගැසීමට ඉල්ලන බවත් ලෝකල් බ්‍රේක් ලයිනර් ගැසුවත් වසරක් පමණ වාහනය දිවිය හැකි බවත් සභාවේ වාහන පරිහරණයේ කිසිදු පාලනයක් නැති බවත් ලේකම්තුමිය හා වාහන භාර නිළධාරි වගකිව යුතු බවත් 5000 KM සවරීස් කල යුතු වාහනය 8000KM ධාවනය කරන විට එන්ජිම ඉතුරු නොවන බවත් එනිසා මේ සම්බන්ධවද පරීක්ෂණයක් කල යුතු බවත් මෙය සෑදිමටද විරුද්ධ බවත් එයටද කමිටුවක් පත් කරන ලෙසත් එන්ජින් ඔයිල් මාරු නොකල විට තෙල් පිච්චීමක් නොව තෙල් අඩුවීමක් වන බවත් මෙය සම්පූණර්යෙන්ම අපරීක්ෂාකාරි ලෙස පරිහරණය කර ඇති බවත් නැතිනම් මෙසේ විය නොහැකි බවත් 5000KM න් වාහනය සවරීස් කරනවා නම් මෙවැනි අපරාධ නොවන බවත් අපේ වාහන 700000KM දුවලත් තාම තෙල් පිච්චෙන් නැති බවත් මේවා මහජන මුදල් බවත් සඳහන් කරමින් මෙයටද සම්පූණර් විරෝධය ප්‍රකාශ කරන ලදි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

මෙම වාහනය සකස් කල යුතු බවත් මෙම වාහනයේ එන්ජිමේ තෙල් පිච්චෙන බව නිතර නිතර ගරු සභාපතිතුමා තමාට පැවසු බවත් ගරු අගලවත්ත මන්ත්‍රීතුමා පැවසු පරිදි එහිදි රියදුරුගේද වැරදි තිබිය හැකි බවත් මාසයකට වරක් රියදුරු මහත්වරු කැඳවා පරික්ෂා කල යුතු බවට තමා පැවසුවේ එනිසා බවත් එසේම මෙම වසංගත කාලයේදි සභාවේ අවශ්‍යතා පිළිබඳව ගරු සභාපතිතුමාට තීරණ ගන්නා ලෙස අපිම පැවසු බවත් වාහන මෙම වසංගත තත්වය මත ඉල්ලීම් කරන පරිදි අවශ්‍ය තැන් වලට සපයන ලෙස අපි පැවසු බවත් මෙම වාහනයේ තෙල් පිච්චෙනවා නම් රියදුරු ලිඛිතව ඒ සම්බන්ධව වාහන භාර නිළධාරිට දැනුම්දිය යුතු බවත් රියදුරුගේ වරද නම් ඔහුට පළාත් පාලන රීති අනුව දඩුවම් දිය යුතු බවත් වාහන සම්බන්ධව දැනුමක් ඇති මන්ත්‍රීවරු සභාවේ සිටින බවත් අවශ්‍ය නම් ඔවුන් කිහිප දෙනෙකු පත් කර මසකට වරක් වාහන පරික්ෂා කර බලා රියදුරන්ට උපදෙස් දිය හැකි බවත් ලේකම්තුමිය මේ සම්බන්ධව අවධානය වැඩියෙන් යොමු කරන ලෙසත් සඳහන් කරමින් මෙම අළුත්වැඩියාව අනුමත කරන බවත් සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

මහ සභා තීරණය දැනුම් දෙන ලෙස සඳහන් කරන ලදි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

මෙම ලොරියේ රෝද හතර දැම්මට අප්‍රේල් මාසයේ රු.44400.00 වැය කර ඇති බවත් මෙය අදහාගත නොහැකි බවත් මාස හතරකින් ගැලවී යා නොහැකි බවත් මෙම වාහනය වහාම සවරීස් කරන ලෙස සඳහන් කර ඇති බවත් නමුත් රියදුරන් හිතුවක්කාරි ලෙස වාහන සවරීස් නොකර ධාවනය කර ඇති බවත් එය අනුගමනය කර නොමැති බවත් එනිසා මේ වාහනයේ අළුත්වැඩියාව සඳහාද තමා විරුද්ධ බව සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

මෙහිදි තමා අසරණ වන බවත් සභාවටම එක් රියදුරෙක් පමණක් සිටින බවත් කොරෝනා වසංගත කටයුතු සදහා යැවීමට,ජලය සැපයීමට,ආහාර ද්‍රව්‍ය බෙදාදීමට අපට රියදුරන් නොමැති බවත් මාගර් කම්කරුවන් යොදවා කටයුතු කරන බවත් ධාවනය සදහා අපට රියදුරන් නැති නිසා එදිනද තමා අනුර නම් බහුකායෙර්න් එවු ළමයා සමඟ තමා ගිය බවත් අපිට රියදුරන් නොදෙන බවත් චක්‍රලේඛණයක් එවා ඇති බවත් එනිසා තමා විශාල ගැටළුවකට මුහුණ පා ඇති බවත් තමාද ත්‍රීරෝදරථ වලින් ගමන් යන බවත් දිගටම විරුද්ධ නොවී සාධාරණව සිතා බලන ලෙසත් ඉල්ලා සිටින ලදි.

<u>ගරු A.H.A රත්නායක මන්ත්‍රීතුමා</u>

එන්ජිමේ ලොකු අළුත්වැඩියාවක් නොමැති බවත් තමා ඇස්තමේන්තුව බැලූ බවත් රු.34000.00 පමණ වැය වන බවත් මෙම වාහනයේ ගම් හතරම කැපි බ්රේක් පෑඩ් වල ඉරි ගිහින් ඇති බවත් මෙම වසංගත තත්වයේදි අපට වාහන අවශ්‍ය නිසා ඒ පිළිබඳව සිතා බලන ලෙස ගරු අගලවත්ත මන්ත්‍රීතුමාගෙන් තමා ඉල්ලා සිටින බවත් සදහන් කරන ලදි.

<u>ගරු මංජුල දිසානායක මන්ත්‍රීතුමා</u>

වාහනය සෑදීම පිළිබඳව ප්‍රශ්නයක් නොමැති බවත් මෙම ගැටළුකාරි තත්වය මත ඉදිරියේදි ප්‍රශ්න ආ හැකි බවත් අද වන තෙක් සවරීස් සෙන්ටර් විවෘත බවත් අප්‍රේල් මාසයේ සවරීස් කරන්න තිබුණානම් කල යුතුව තිබු බවත් සභාව වැරදි නැති බවත් නිළධාරින් වගකීම භාරගත යුතු බවත් අවසානයේ ගැටළුව සභාවටම එන බවත් එහි නීතිමය තත්වය ගරු අගලවත්ත මන්ත්‍රීතුමා දන්නා නිසා අදහස් දැක්වු බවත් මේවා මහජන මුදල් බවත් මෙවැනි ප්‍රශ්න නිසා ඉදිරියේදි දේශපාලනය කිරිමේදි අපටද ගැටළු ඇති වන බවත් එනිසා මෙම වාහනය සෑදීමට විරුද්ධ නැති බවත් එහි වගකීම නිළධාරින් හා රියදුරන් භාරගත යුතු බවත් මෙහි ගරු සභාපතිතුමාගේ වරදක් නොමැති බවත් කාමරීක නිළධාරි මේ සම්බන්ධයෙන් සොයා බැලිය යුතු බවත් ගරු මන්ත්‍රී මණ්ඩලයද මේ ගැන සොයා බැලිය යුතු බවත් වාහන පිළිබඳව පමණක් සෑම දිනම සභාවේ කථා කරන බවත් වෙනත් කිසිවක් පිළිබඳව අපට කථා කිරීමට අවස්ථාවක් නැති බවත් සදහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

කුමන හෝ ස්ථානයකින් ප්‍රවාහන පහසුකම් ඉල්ලා සිටින විට කවුරුන් හෝ යොදවා ධාවන කටයුතු කරන බවත් එනිසා විනය පරික්ෂණ කළාට කමක් නැති බව සදහන් කරන ලදි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

රියදුරන්ට නිළධාරින් පවසන දේ ඔවුන් නොකරන බවත් විනය ක්‍රියාමාගර් ගත යුතු බවත් සදහන් කරන ලදි.

<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>

අළුත්වැඩියාවට රු.145000.00 මිලක් ඉදිරිපත් කර ඇති බවත් එහි සාධාරණයක් ඇති බවත් ඉදිරිපස හා පිටුපස බ්රේක් ලයිනර් සදහා රු.31000.00 වන බවත් කලින් සකස් කරන අවස්ථාවේදි .44400.00ක බිලක් ඇති බවත් මෙම ගණන් වල වෙනසක් ඇති බවත් රු.145000.00 න් රු.31000.00 ගිය විට රු.115000.00 පමණ එන්ජිම් හෙඩ් එක ආදි කාරණා වලට වෙන් කර ඇති බවත් ඊට අමතරව මාස්ටර් පොම්පයේ රෙපෙයාර් එකට රු.9000.00 ගොස්

ඇති බවත් මාටර්ර් පොම්පයේ රෙපෙයාර් කාරණාවේදි මාටර්ර් පොම්පයේ වොශර් සෙට් එකට රු.2250.00 ලෙසත් රෙපෙයාර් කිට් එකට රු.5900.00 දමා ඇති බවත් රෙපෙයාර් කිට් එක දැමූ විට වොශර් යන කාරණාව එයට අදාළ නැති බවත් එහි පොඩි පරස්පරතාවයක් ඇති බවත් සමස්ථයක් ලෙස අළුත්වැඩියා කිරීමට එක්සත් ඩීසල් මෝටසර් මඟින් එවා ඇති මිල ගණන් සාධාරණ බවත් එම මිලට රෙපෙයාර් කිරිම සුදුසු බවත් නමුත් දිගටම මෙය කල නොහැකි බවත් යම්කිසි දෝෂයක් සිදුවී ඇත්නම් මේ සම්බන්ධව රියදුරන් හා නිළධාරින් දැනුවත් කර මින් ඉදිරියට මෙසේ නොවීමට ක්‍රමවේදයක් සකස් කල යුතු බවත් මින් පසු වාහන අළුත්වැඩියාවේදි මිල සම්බන්ධව සාකච්ඡා කර විකල්පයකට එමු යැයි සඳහන් කරන ලදි.

<u>තීරණ අංක 05.1 (6)</u>

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

5 (1.6)දොළුව මහජන පුස්තකාලය ඩිජිටල් පුස්තකාලයක් ලෙස සංවධර්නය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පොත් 10000ක පමණ සුචිකරණ දත්ත 2021.12.20 දිනට පෙර පරිසණකගත කල යුතු බවත් ඒ සඳහා පුස්තකාල නිළධාරින්ට අමතරව ජාතික ආධුනිකත්ව සහ කාමරීක පුහුණු ආයතනයේ පුහුණුකරුවෙකු වන පුස්තකාල විද්‍යාව හදාරා ඇති අයි.ඒ.ඩී.ධනුෂ්ක මධුශාන් ඉලේපෙරුම මයා යොදවා ඇති අතර කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කල පරිදි එම පුහුණුලාභියාට දත්ත ඇතුළත් කරන දින වලදි දිනකට රු.500.00ක දිමනාවක් ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>**ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා**</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

<u>තීරණ අංක 05.1 (7)</u>

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

5 (1.5)කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිළධාරින් සේවයේ යොදවා ගැනීම යටතේ තාක්ෂණ නිළධාරි යූ.අයි.වීරසූරිය මහත්මිය උඩපළාත ප්‍රාදේශීය සභාවේ සේවය සඳහා යොදවා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>**ගරු අගලවත්ත මන්ත්‍රීතුමා**</u>

කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික තාක්ෂණ නිළධාරි යූ.අයි.වීරසූරිය මහත්මිය උඩපළාත ප්‍රාදේශීය සභාවේ සේවය සඳහා යොදවා ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

තීරණ අංක 05.1 (8)

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

5 (1.8)පුස්සැල්ලාව නගරශාලා භූමියේ ඉන්ටලොග් ගල් ඇල්ලීමේ කටයුතු ගල්කුඩු නොමැති නිසා පසුගිය දිනවල සිදුනොවුන බැවින් ගල්කුඩු කියුබ් 3ක් සහ සිමෙන්ති මිටි 10ක් මිලදී ගැනීම සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

*ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා*

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

**කමර්ාන්ත අනුමැතිය**

**කමර්ාන්ත යෝජනා**

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතාගේ **යෝජනා**

5 (2.1)තුංදෙණිය වසමේ ගල්ගෙඩිය මාගර්යේ බංඩේ මහතාගේ නිවස අසළින් ගම්පොලවත්ත රෙට්ට වංගුව දක්වා මාගර්ය සංවධර්නය කිරීම රු. 200000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.2)මොරහේන මිනුවන් වැව ඉහළ මාගර්ය සංවධර්නය කිරීම රු. 200000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.3)ආඩියාකඩවත සුසානභූමිය අසලින් ගමට යන මාගර්ය සංවධර්නය කිරීම රු. 200000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.4)ඉල්ලගොල්ල මාගර්යේ බෝක්කුව සංවධර්නය කිරීම රු.200000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**සංශෝධන කමර්ාන්ත**

**ගරු මොහොමඩ් මුරාඩ් මන්ත්‍රීතුමාගේ යෝජනා**

5 (2.5)උනම්බුව මයුර වලව්ව අසළ රියාස් මොහොමඩ් මයාගේ නිවස ඉදිරිපිට කාණුව හා කාණු ආවරණය ඉදිකිරීම රු.150000.00 කමර්ාන්තය හා ෆවුස් මයාගේ නිවස අසළින් යන කාණුව සකස් කිරීම රු. 200000.00 කමර්ාන්තය වෙනුවට සංශෝධන කමර්ාන්ත ලෙස,

අංක 60/4/A නියංගදෙණිය උනම්බුව එස්.ක්‍රිෂ්ණකුමාර් මහතාගේ නිවස අසළ මාගර්යේ පැති බැම්ම සහ පඩිපෙළ සකස් කිරීම රු. 350000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු සුභද්‍රා සමරනායක මන්ත්‍රීතුමියගේ යෝජනා**

5(2.6) හපුගස්පිටිය යකඩාදෙණිය පාළම අසළ සිට ජී.ඒ.අබේරත්න මහතාගේ නිවස දක්වා මාගර්ය කොන්ක්‍රීට් කිරීම රු.300000.00 කමර්ාන්තය වෙනුවට සංශෝධන කමර්ාන්ත ලෙස,

i) හපුගස්පිටිය මවුන්ෆීල්ඩ් ජනපදයේ චන්දන උදයකුමාර මහතාගේ නිවස අසළ මාගර්ය කොන්ක්‍රීට් කිරීම රු.100000.00 ද

ii) හපුගස්පිටිය ප්‍රජා ශාලාව දක්වා ඇති මාගර්ය පාළම අසළ සිට කොන්ක්‍රීට් කිරීම රු.200000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු කීතර්ි රත්නායක මන්ත්‍රීතුමා</u>

ඉදිරිපත් කර ඇති සියළුම කමර්ාන්ත යෝජනා සහ සංශෝධිත කමර්ාන්ත යෝජනා ඉටුකිරීම සුදුසු බවට ගෙන ආ යෝජනා මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>(6) කාරක සභා වාථර්ා කමිටු වාතර්ා ඉදිරිපත් කිරීම</u>

1. 2021 අගෝස්තු මාසයට අදාළ ධාවන සටහන් වාථර්ා ඉදිරිපත් කිරීම

2.2021/08/17 දින හා 2021/09/10 දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාථර්ා ඉදිරිපත් කිරීම

3. 2021/08/ 05 දින කමර්ාන්ත කමිටු වාථර්ාව ඉදිරිපත් කිරීම

<u>ගරු කීතර්ි රත්නායක මන්ත්‍රීතුමා</u>

1. 2021 අගෝස්තු මාසයට අදාළ ධාවන සටහන් වාථර්ා, 2021/08/ 17 දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාථර්ාව සහ 2021/09/10 දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාථර්ාව, 2021/08/ 05 දින කමර්ාන්ත කමිටු වාථර්ාව යන සියළුම කමිටු වාථර්ා පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරමි.

*<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>*

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

**(7) ආදායම් වියදම් වාථර්ා ඉදිරිපත් කිරීම** -2021 අගෝස්තු මස ආදායම් වියදම් වාථර්ාව හා ආදායම් ප්‍රගති වාථර්ාව සභාවට ඉදිරිපත් කරන ලදි.

## ආදායම් වියදම් වාර්තාව - 2021 අගෝස්තු

| | ආදායම් | | | | වියදම් | |
|---|---|---|---|---|---|---|
| | වරිපනම් හා බදු | | | 1 | වැටුප් හා දීමනා | 4,708,472.46 |
| i | වරිපනම් හා බදු | 17,322.05 | | | | |
| ii | අක්කර බදු | 1,000.00 | | 2 | ගමන් වියදම් | 90,342.00 |
| iii | ජල ගාස්තු | 2,125.00 | | | | |
| iV | ව්‍යාපාර බදු | 76,900.00 | 97,347.05 | 3 | සැපයුම් හා උපකරණ | 444,809.00 |
| **20** | කුළී | | | | | |
| i | ගෙවල් කුළී | 1,625.00 | | 4 | ප්‍රාග්ධන වත්කම් | |
| ii | වෙළඳ අයිතිය බදු දීම | 256,463.33 | | | අළුත්වැඩියාව හා නඩත්තුව | 61,175.00 |
| iii | පොදු වැසිකිළිය | 10,000.00 | | | | |
| iv | බදු මුදල් | - | | | | |
| v | කුලියට දීම | - | 268,088.33 | | | |
| **30** | බලපත්‍ර ගාස්තු | | | | | |
| i | වෙළඳ බලපත්‍ර | 202,518.02 | | 5 | ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍යක සේවා | 253,522.17 |
| ii | වෙළඳ බලපත්‍ර ත්‍රිරෝද | 9,600.00 | 212,118.02 | | | |
| **40** | සේවා සඳහා ගාස්තු | | | | | |
| i | ලී.ප. සහතික හා පරීක්ෂණ ගාස්තු | 85,632.58 | | 6 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | 8,425.94 |
| ii | අය කර ගත හැකි ගාස්තු | 113,540.98 | 199,173.56 | | | |
| **50** | වරෙන්තු ගාස්තු හා දඩ | | | 7 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 1,067,213.98 |
| i | දඩ මුදල් | 5,970.00 | 6,864.43 | | | |
| 2 | වරෙන්තු ගාස්තු | 894.43 | | | | |
| **60** | වෙනත් ආදායම් | | | | | |
| i | පොලී | | | 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ පාරිතෝෂික | - |
| ii | විකුණුම් | 299,585.00 | | | | |
| iii | මුද්දර ගාස්තු | - | | | | |
| iV | සේවක ණය පොලී | 54,152.65 | 353,737.65 | | | |
| **70** | වෙනත් ආධාර | | | 9 | ප්‍රාග්ධන වැය | 894,855.24 |
| i | පරිපාලනමය ප්‍රතිපූර්ණ | - | | | | |
| ii | සාමුහික ආධාර | - | | | | |

| | | | |
|---|---|---|---|
| | - | | |
| **80** මුලධන ලැබීම් | | අත්තිකාරම් ගෙවීම | - |
| i මුලධන ආධාර | - | සේවක ණය | 189,350.00 |
| සේවක ණය | 351,848.00 | ණයහිමි ගෙවීම් | 500,151.17 |
| තැන්පත් | 195,096.77 | තැන්පත් | 309,212.17 |
| කර්මාන්ත ණයගැති ලැබීම් | - | ස්ථාවර තැන්පත් | - |
| අත්තිකාරම් පියවීම | 48,308.00 | අතිරික්තය | |
| ඌනතාවය | 6,794,947.32 | | |
| | **8,527,529.13** | | **8,527,529.13** |

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

2021 අගෝස්තු මස ආදායම් වියදම් වාර්තාව හා ආදායම් ප්‍රගති වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

*ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා*

2021 අගෝස්තු මාසයට අදාළ ආදායම් වියදම් වාර්තාව ඉදිරිපත් කර ඇති බවත් පසුගිය මාස වල ලෙසම රු.8,527,529.13 ක වැයක් රු.6,794,947.32 ක ඌනතාවයක් සහිතව ආදායම් වියදම් වාර්තාව ඉදිරිපත් කර ඇති අතර මෙහිදි පැහැදිලි කාරණය නම් රු.8,527,529.13 වියදම් කරන විට එම මාසය තුළ අපේ රු.6,794,947.32 ක ඌනතාවයක් පෙන්වන විට එහි සැබෑ ආදායම රු. ලක්ෂ 14-19 පමණ සීමා වි තිබීම බවත් මෙම තත්වය තුළ ඉතාමත්ම අපහසුවෙන් අත්‍යාවශ්‍ය වියදම් කරගෙන යන ගමන් තාක්ෂණ වැය හා ණයහිමි ගෙවීම් ආදිය සඳහාද මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබීම සම්බන්ධව අපි සතුටු විය යුතු අතර මෙවැනි ඉතාමත් අඩු ආදායම් තත්වයක් තුළ වුවත් අපේ ගරු මන්ත්‍රී මණ්ඩලයේ සහ සභාවේ අවශ්‍යතා සඳහා මුදල් වියදම් කිරීම සම්බන්ධව ඉතාමත් සතුටු වන බවත් එසේම මේ පිළිබඳව දීසර් විස්තරයක් නොකරන බවත් සඳහන් කරමින් 2021 අගෝස්තු මස ආදායම් වියදම් වාර්තාව හා ආදායම් ප්‍රගති වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

අද දින සභාවට නොපැමිණි ගරු ***මන්ත්‍රීතුම***න්ලාගේ සහ ***මන්ත්‍රීතු***මියන්ලාගේ නිවාඩු අනුමැතිය සඳහා සභාවට යොමු කරන ලදි.

*ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා*

අද දින මාසික මහ සභාවට නොපැමිණි සියළුම මන්ත්‍රීතුමන්ලාගේ මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට මම යෝජනා කරමි

**<u>ගරු සුසිලාවති මන්ත්‍රීතුමිය</u>**

අද දින මාසික මහ සභාවට සහභාගි නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.



<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව* මහ සභාව *තීරණය කරන ලදි.*

## <u>8. වෙනත්</u>

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමාගේ නැන්දනිය මිය ගොස් ඇති අතර ඒ පිළිබඳව තමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයේ ශෝකය ප්‍රකාශ කරන බවත් එම අවමංගල අවස්ථාව සඳහා සහභාගි විය හැකි අය ඒ සඳහා සහභාගී වන ලෙසත් සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

අද දින එන්නත්කරණ කටයුතු තිබියදි ඒ සඳහා සහභාගී වීම පමා කොට පවතින වසංගත තත්වය මත අවධානමක්ද තිබියදි විවිධ ගැටළුකාරි තත්වයන් මත උඩපළාතේ ජනතාව වෙනුවෙන් අද දින මහ සභාවට සහභාගී වු ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කායර් මණ්ඩලයටත් ස්තුතිවන්ත වෙමින් සියළු දෙනාට දළදා සමිදු පිහිට ප්‍රාථර්නා කරමින් ප.ව.12.00.ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදි

ලේකම් සභාපති

උඩපළාත ප්‍රාදේශීය සභාව උඩපළාත ප්‍රාදේශීය සභාව